# 38 일할 맛이 나요

වැඩකරන්න ආසා හිතෙනවා

## 학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

| | |
|---|---|
| □ අධ්‍යයන අරමුණු | වැඩපළේ පරිසරය / වටපිටාව හඳුන්වා දීම, සම සේවකයන් සමඟ ඇති වන ගැටුම් පැහැදිලි කර දීම |
| □ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස් | -는/(으)ㄴ 편이다, -다고 하다 |
| □ වචන භාවිතය සඳහා උපදෙස් | වැඩපළේ පරිසරය,, සම සේවකයන් සමඟ ඇති වන ගැටුම් |
| □ සංස්කෘතික තොරතුරු | වැඩපළේ තනතුරු |

## 대화 1 සංවාදය 1

Track 118

පරු සහ රිහාන් ආයතනයේ තත්වය (පරිසරය)පි□□බ□ කතාකරමින් සිටියි. පළමුව සංවාදයට දෙවරක් සවන් □□ අනුගමනය කරන්න.

**바루** 리한 씨 회사는 분위기가 어때요?
රිහාන් මහත්මයාගේ ආයතනයේ පරිසරය කොහොමද?

**리한** 동료들끼리 서로 위해 주니까 항상 즐겁게 일하는 편이에요.
සම සේවකයන් එකිනෙකාට ගරු කරන නිසා නිතරම විනෝදයෙන් වැඩ කරනවා.

**바루** 회사 분위기도 자유로운 편이에요?
ආයතනයේ පරිසරය නිදහස් ද?

**리한** 글쎄요. 규율은 좀 엄격한데요, 윗사람들이 아랫사람을 많이 배려해 줘서 일하기는 편해요.
එහෙමයි. නීති ටිකක් දැඩියි. ජ්‍යේෂ්ඨ අය කණිෂ්ඨ අයට ගොඩක් කාරුණික වන නිසා වැඩ කිරීම පහසුයි.

**바루** 정말 부러워요. 그러면 훨씬 일할 맛이 나겠어요.
ඇත්තටම ඊර්සියා හිතෙනවා. එහෙම නම් වැඩ කරන්න ගොඩක් ආසා හිතෙනවා ඇති.

**리한** 맞아요. 회사 오는 게 즐거우니까 일도 더 잘돼요.
නිවැරදියි. ආයතනයට එන එක විනෝද නිසා වැඩත් තව හොඳට කරනවා.

**끼리** අතර (සමඟ)
· 오랜만에 고향 친구들끼리 노래방에 갔어요.
බොහෝ කාලයකින් ගමේ මිතුරන් සමඟ කැරොකේ එකට ගියා.

**맛이 나다** කරන්න ආසා හිතෙනවා.
කුමන හෝ වැඩක් කැමැත්තෙන් එසේත් නැත්නම් විනෝදයෙන් කරනවා.
· 수업 분위기가 좋으니까 요즘 공부할 맛이 나요.
පන්ති කාමරයේ පරිසරය හොඳ නිසා මේ දිනවල හොඳට ඉගෙන ගන්න හිතෙනවා.
· 가족들이 맛있게 먹어 주니까 요즘은 요리할 맛이 나네요.
පවුලේ අය රසකර කන නිසා මේ දවස් වල හොඳට උයන්න ආසා හිතෙනවා.

හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 리한 씨의 회사 분위기가 어때요?
   රිහාන් මහත්මයාගේ ආයතනයේ පරිසරය කොහොමද?
2. 바루 씨는 왜 리한 씨를 부러워해요? පරු මහත්මයා ඇයි රිහාන් මහත්මයට ඊර්සියා කරන්නේ?

정답 1. 동료들끼리 서로 위해 주니까 즐겁게 일하는 편이에요. 2. 리한 씨의 회사 분위기가 좋아서요.



## 어휘 1 වචන මාලාව 1 직장의 분위기 රැකියා ස්ථානයේ පරිසරය/වටපිටාව



කුමන පරිසරයක් සහිත රැකියා ස්ථානයක ද වැඩ කරන්න කැමති? රැකියා ස්ථානයේ පරිසරය / වටපිටාව හා සබැඳි විවිධ වචන හා ප්‍රකාශයන් විමසා බලමු ද?



동료
සම සේවකයන්




상사
ජ්‍යෙෂ්ඨයා



부하
කණිෂ්ඨයා



사이가 좋다
මිතුදම හොඳයි




사이가 나쁘다
මිතුදම නරකයි




격려하다
උනන්දු කරනවා



서로 위해주다
එකිනෙකාට ගරු කරනවා



분위기가 좋다
වැඩ කරන පරිසරය / වටපිටාව හොඳයි



분위기가 나쁘다
වැඩ කරන පරිසරය / වටපිටාව නරකයි



자유롭다
නිදහස්



규율이 엄격하다
නීති තදයි

- 사장님은 직원들을 **격려해** 주세요. ආයතන ප්‍රධානියා වැඩකරන පුද්ගලයින් දිරි ගන්වන්න.
- 동료들이 **서로 위해 주니까** 분위기가 좋아요.
  සම සේවකයන් එකිනෙකාට උදවු කරදීම නිසා වටපිටාව හොඳයි.
- 회사 **규율이 엄격해서** 넥타이를 매야 해요. ආයතනයේ විනය ඉතා දැඩි බැවින් ටයි පටිය පැළඳිය යුතුය.



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ගැටළුව විසඳීමට උත්සාහ කරන්න.

1. 빈칸에 맞는 표현을 골라 대화를 완성하세요. හිස්තැනට ගැළපෙන ප්‍රකාශය තෝරා සංවාදය සම්පූර්ණ කරන්න.

1) 가: 리한 씨는 투안 씨랑 안 친한 것 같아요. රිහාන් මහතා තුවාන් මහතා සමග සමීප නැහැ වගෙයි.
나: 네, 지난번에 말다툼을 한 이후로 ______________________.
ඔව්. ගිය වතාවේ කලහ කරගත්ත වෙලාවේ ඉඳලා (මිතුදම හොඳ නැති වෙලා).

① 사이가 좋아졌어요 ② 사이가 별로 안 좋아졌어요

2) 가: 신입사원이 들어왔는데 일이 너무 느려서 답답해요.
අලුත් සේවකයන් ආපු නිසා වැඩ ගොඩක් හිමිහිට වෙන නිසා හිතට බරයි.
나: 많이 가르쳐 주세요. 아직 일을 잘 모르는 __________(이)잖아요.
ගොඩක් කියලා දෙන්න. තාමත් වැඩ හොඳටම දන්නේ නැති කනිෂ්ඨ සේවකයන් නිසා.

① 상사 ② 부하 직원

정답 1) ② 2) ②

## 문법 1 සංවාදය 1 -는/(으)ㄴ 편이다


G38-1

ක්‍රියාපදයකට හෝ විශේෂණ පදයකට සම්බන්ධ කර නිසැක ලෙස කථා කිරීමට වඩා දළ වශයෙන් යම් පැත්තකට ආසන්න බව හෝ ඇතුළත් වන බව අදහස් කිරීමට යොදා ගැනේ.

| 동사 (ක්‍රියාපදය) | 형용사 (විශේෂණ පදය) | |
|---|---|---|
| **-는 편이다** | 자음 (ව්‍යඤ්ජනය) → **-은 편이다** | 모음 (ස්වර), 자음 'ㄹ' (ව්‍යඤ්ජනය-ㄹ) → **-ㄴ 편이다** |
| 많이 먹다 → 많이 먹**는 편이다**<br>자주 가다 → 자주 가**는 편이다**<br>잘 만들다 → 잘 만드**는 편이다** | 좋다 → **좋은 편이다** | 크다 → **큰 편이다**<br>멀다 → **먼 편이다** |

ක්‍රියා පදයකට ඉදිරියෙන් '잘, 잘못, 많이, 자주' වැනි ප්‍රමාණයක් හෝ වාර ගණන හඟවන ක්‍රියා විශේෂණ යොදා ගනී.

- 가: 비빔밥을 좋아하세요? පිපිම්පප්වලට කැමතිද?
  나: 네, 자주 **먹는 편이에요**. ඔව් නිතරම කනවා.
- 가: 지훈 씨 일하는 곳은 어때요? ජිහුන් මහතා කොහොමද වැඩ?
  나: 분위기가 **좋은 편이에요**. හොඳින් කෙරෙන පාටයි.
- 한국의 여름 날씨는 비가 오고 **더운 편이에요**. කොරියාවේ සරත් සෘතු කාලගුණය වැසි වහින අතර රස්නෙයි.




'-는/(으)ㄴ 편이다' තේරුම් ගත්තා ද? උදාහරණයේ දැක්වෙන අන්දමට දෙබස සම්පූර්ණ කරන්න.

2. '-는/(으)ㄴ 편이다'를 사용해서 〈보기〉처럼 대화를 완성하세요
'-는/(으)ㄴ 편이다' භාවිතා කරමින් උදාහරණය ලෙස සංවාදය සම්පූර්ණ කරන්න.

보기



가: 직장 분위기가 어때요?
රැකියා ස්ථානයේ පරිසරය / වටපිටාව කොහොමද?
나: 자유로운 편이에요. ( ගොඩක් ) නිදහස්.

1) 

2) 

3) 

4) 

정답 1) 분위기가 나쁜 2) 서로 위해주는 3) 규율이 엄격한 4) 분위기가 좋은

### 유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

**손발이 잘 맞아요.** එකිනෙකා හොඳින් ගැලපෙනවා

가: 투안 씨 팀은 항상 분위기가 좋은 것 같아요. තුවාන් මහත්මයගේ කණ්ඩායමේ පරිසරය නිතරම හොඳයි වගෙයි.
나: 네, 팀원들끼리 **손발이 잘 맞아요**. ඔව්. **කණ්ඩායම් සාමාජිකයන් එකිනෙකා හොඳින් ගැලපෙනවා.**

## 대화 2 සංවාදය 2

Track 119



ජිහුන්, තුවාන් ගෙන් පරූ සමඟ රණ්ඩු කිරීම පිළිබඳ විමසමින් සිටියි. මුලින්ම දෙබස දෙවරක් අසා අනුගමනය කරන්න.

**지 훈** 투안 씨, 조금 전에 바루 씨하고 왜 싸운 거예요?
තුවාන් මහත්මයා, ටිකකට ක□□□□ පරූ මහත්මයා සමඟ රණ්ඩු වුණේ ඇයි?

**투 안** 별일 아니에요. 바루 씨가 제 말에 대답을 하도 안 해서 저를 무시하는 줄 알았어요. 그런데 기계 소리 때문에 못 들었다고 하더라고요.
විශේෂ දෙයක් නෙවෙයි. පරූ මහත්මයා මගේ එක වචනයකටවත් උත්තර දෙන්නෙත් නැති නිසා මාව නොසළකා හරින බව දැණුනා. ඒ උනත් මැෂින් එකේ ශබ්දය නිසා ඇහුනේ නැහැ කියලා කියනවා.

**지 훈** 아, 그럼 서로 오해한 거네요. 이젠 화해 했지요?
ආ, එහෙනම් වැරදි වැටහීමක්නේ. දැන් මිත්‍ර වුනා ද?

**투 안** 그럼요. 저도 사과했고, 바루 씨도 미안하다고 했어요.
එහෙමයි. මමත් සමාව ගත්තා. පරූ මහත්මයත් සමා වෙන්න කියලා කිව්වා.

**지 훈** 잘했어요. 동료끼리 잘 지내야지요.
හොඳයි. එකට වැඩ කරන අය හොඳින් ඉන්න ඕනේ.

> **하도** ගොඩක් / බොහෝ
> ගොඩක් බැරෑරුම් හෝ ගොඩක් විශාල යන්න අවධාරණය කරන විට
> · 하도 바빠서 밥 먹을 시간도 없다.
> ගොඩක් වැඩ වැඩි නිසා ආහාර ගන්නත් වෙලාවක් නැහැ.

> **-더라고요**
> අතීතයේ ලද අත්දැකීමකින් අළුතෙන් දැනගත් දෙයක් වර්තමානයේදී යමෙකුට ප්‍රකාශ කිරීමේදී භාවිතා කරන ප්‍රකාශයකි.
> · 한국 음식이 참 맛있다고 하더라고요.
> කොරියානු ආහාර ගොඩාක් රසයි.



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 바루는 왜 투안의 말을 못 들었어요? පරූට ඇයි තුවාන්ගේ වචන ඇහුනේ නැත්තේ?
2. 투안과 바루는 서로 화해했어요? තුවාන් සහ පරූ එකිනෙකා සමඟ මිත්‍ර වුනා ද?

정답 1. 기계 소리 때문에 못 들었어요. 2. 네, 두 사람은 서로 화해했어요.

### Tip 간접화법 වක්‍ර කථනය


간접화법은 다른 사람의 말을 옮겨 말할 때 사용하는 화법으로 문장의 종결 유형에 따라서 다르게 실현된다. 옮겨 말하는 문장이 평서문일 때는 '-다고 하다'를, 명령문일 때는 '-(으)라고 하다'를, 의문문일 때는 '-냐고 하다'를, 청유문일 때는 '-자고 하다'를 사용한다.

වක්‍ර කථනය යනු වෙනත් පුද්ගලයෙකුගේ ප්‍රකාශයක් නැවත ප්‍රකාශ කරන විට භාවිතා කරන කථන ක්‍රමයකි. වාක්‍යයේ ස්වභාවය අනුව කථන ක්‍රමය වෙනස්වේ. සාමාන්‍ය වාක්‍ය වලදී '-다고 하다' විධාන කරන විට '-(으)라고' ප්‍රශ්නවාචී ප්‍රකාශ වලදී '-냐고 하다' යමක් යෝජනා කරන විට '-자고 하다' භාවිතා කරයි.

## 어휘 2 වචන මාලාව 2 동료와의 갈등 එකට වැඩ කරන සේවකයන් අතර ගැටළු


එකට වැඩ කරන සේවකයන් අතර ගැටළු හා සම්බන්ධ කුමන ප්‍රකාශණ තිබේදැයි විමසා බලමු ද?


때리다
ගහනවා


맞다
පහර ලබනවා


욕을 하다
නරක වචන කියනවා


짜증을 내다
අවුස්සනවා / කෝප කරනවා



화가 나다
තරහ ගන්නවා


화를 내다
බනිනවා


싸움을 하다
රණ්ඩු වෙනවා


말다툼을 하다
බැන ගන්නවා

- 장난이 심한 동생 때문에 **화가 났어요.** 그래서 동생에게 **화를 냈어요.**
  සීමාව ඉක්මවා විහිලු කරන මල්ලි නිසා කේන්ති ගියා. ඒ නිසා මල්ලීට බැන්නා.
- 친구끼리 서로 **싸움을 하면** 안 돼요.
  යහළුවන් අතර රණ්ඩු වෙන්න එපා.
- 사소한 일 때문에 **말다툼을 했어요.**
  පොඩි දෙයකට බැන ගත්තා.


오해하다
වරදවා තේරුම් ගන්නවා


오해를 풀다
වරදවා තේරුම් ගැනීම නැති වෙනවා


사과하다
සමාව ගන්නවා


화해하다
මිත්‍ර වෙනවා

- 엄마는 내가 꽃병을 깼다고 **오해했지만** 곧 **오해를 풀었어요.**
  අම්මා මම මල් පෝච්චිය කැඩුව බවට වරදවා වටහා ගත් නමුත් ඉක්මනින් වැරදි වැටහීම නැති කර ගත්තා.
- 친구에게 미안하다고 **사과하고** 우리는 서로 **화해했어요.**
  යහළුවාගෙන් සමාව ගෙන අපි නැවත මිත්‍රවුණා.

ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමු ද?

**1. 빈칸에 맞는 표현을 골라 대화를 완성하세요.** හිස්තැනට ගැළපෙන ප්‍රකාශය තෝරා සංවාදය සම්පූර්ණ කරන්න.

1)
가: 둘이 왜 싸운 거예요? දෙදෙනා ඇයි රණ්ඩු වෙන්නේ?
나: 제 잘못이에요. 제가 바루 씨 말을 ______________.
මගේ වැරැද්ද. මම පරු මහත්මයව (වරදවා වටහා ගත්තා).

① 오해했어요 ② 오해를 풀었어요

2)
가: 지훈 씨하고 싸웠어요? ජිහුන් මහත්මයා සමග රණ්ඩු වුණා ද?
나: 자꾸 저를 무시하는 것 같아서 참다가 ______________.
නිතරම මාව නොසළකා හරිනවා වගේ නිසා ඉවසීමට නොහැකිව (බැන්නා).

① 화를 냈어요 ② 화해했어요

정답 1) ① 2) ①


## 문법 2 සංවාදය 2 　-다고 하다

G38-2

කථකයා වෙනත් පුද්ගලයකු පැවසූ දේ නැවත පැවසීමේදී යොදාගනී. නැවත පවසන වාක්‍යය ප්‍රකාශනාර්ථය හඟවන වාක්‍යයක් වනවිට අනෙක් පාර්ශවය වෙත '-다고 하다' යොදා ගනිමින් ප්‍රකාශ කෙරේ. අතීත කාලය හැඟවීමේදී 'A/V -았/었다고 하다' ද අනාගත කාලය සඳහා 'A/V- (으)ㄹ 거라고 하다' යොදාගනී.

| 동사 (ක්‍රියාපදය) | 형용사 (විශේෂණ පදය) | 명사 (නාම පදය) | |
|---|---|---|---|
| -ㄴ/는다고 하다 | -다고 하다 | 자음 (ව්‍යඤ්ජනය) → **이라고 하다** | 모음 (ස්වරය) → **라고 하다** |
| 가다 → 간**다고 하다**<br>먹다 → 먹**는다고 하다** | 바쁘다 → 바쁘**다고 하다**<br>많다 → 많**다고 하다** | 학생 → 학생**이라고 하다**<br>가수 → 가수**라고 하다** | |

- 이 사람이 한국에서 가장 인기 있는 **가수라고 해요**.
  මේ පුද්ගලයා කොරියාවේ ඉතා ප්‍රසිද්ධ ගායකයෙකු කියලා කියනවා.
- 가: 아상카 씨는 이제 고향에 돌아가는 거예요? අසංක මහත්තයා ගමට යනවද?
  나: 네, 다음 달에 고향으로 **간다고 해요**. ඔව්, ලබන මාසේ ගමට යනවා කියලා කියනවා.
- 가: 요즘 공장이 좀 바빠진 것 같아요. මේ දවස්වල කර්මාන්තශාලාව ටිකක් කාර්යබහුල වෙලා වගේ.
  나: 네, 주문이 늘어서 일이 좀 **많다고 해요**. ඔව්. ඇණවුම් වැඩි වෙලා වැඩ ටිකක් වැඩියි කියලා කියනවා.



'-다고 하다' ඔබ තේරුම් ගත්තා ද? එහෙ මනම් උදාහරණයේ දැක්වෙන ආකාරයට සංවාදය සම්පූර්ණ කරන්න.

2. '-다고 하다'를 사용해서 〈보기〉처럼 대화를 완성하세요.
'-다고 하다' භාවිතා කරමින් සංවාදය සම්පූර්ණ කරන්න.

보기




투안 씨가 수피카 씨하고 말다툼을 하다.
තුවාන් මහත්මයා සුපිකා මහත්මිය සමඟ බැන ගන්නවා.

투안 씨가 수피카 씨하고 말다툼을 했다고 해요.
තුවාන් මහත්මයා සුපිකා මහත්මිය සමඟ බැන ගත්තා යැයි කියනවා.

1) 
투안 씨가 이반 씨하고 화해하다

______________________

______________________

2) 
수피카 씨가 투안 씨를 때리다

______________________

______________________

3) 
이반 씨가 수피카 씨에게 사과하다

______________________

______________________

4) 
투안 씨가 이반 씨하고 싸움을 하다

______________________

______________________

정답 1) 투안 씨가 이반 씨하고 화해했다고 해요. 2) 수피카 씨가 투안 씨를 때렸다고 해요.
3) 이반 씨가 수피카 씨에게 사과했다고 해요. 4) 투안 씨가 이반 씨하고 싸움을 했다고 해요.

## 활동 ක්‍රියාකාරකම්

직장 분위기에 대한 글입니다. 잘 읽고 질문에 답하세요.

වැඩ කරන ස්ථානයේ පරිසරය පිළිබඳ ඡේදයකි. හොඳින් කියවා ප්‍රශ්ණ වලට පිළිතුරු ලබා දෙන්න.

NEWS TIMES

### 신바람 나는 직장 분위기 만들기

인주시가 활기찬 직장 분위기를 만들기 위해 직원들을 대상으로 다양한 행사를 마련하여 주위의 관심을 모으고 있다. 인주시는 '생일 케이크 선물하기', '동료와 함께 커피 한 잔'과 같은 행사를 통해 직원들이 출근하고 싶은 직장이 되도록 노력하고 있다. 가을에는 '야구장 가기', '영화 보기' 등과 같이 많은 직원들이 함께 할 수 있는 행사를 준비하고 있다. 인주시의 김민수 시장은 직장 분위기도 이제는 윗사람이 주도하던 엄격한 분위기에서 직원들이 행복해 할 수 있는 분위기로 바뀌어야 한다고 말했다.




හොඳ වැඩ පරිසරයක් සෑදීම

ඉජුන්සි උනදුවෙන් වැඩ කරන පරිසරයක් සෑදීමට සේවකයන් ඉලක්ක කරගත් විවිධ අංග සූදානම් කොට වටපිටාවේ සියලු දෙනාගේ අවධානය ලබමින් සිටියි. ඉජුන්සි උපන්දින කේක් තෑගි කිරීම, සේවකයින් සමග එකට කෝපි වීදුරුවක් පානය කිරීම වැනි දේවල් මගින් සේවකයන් රැකියාවට යාමට කැමති වැඩපොළක් තැනීමට මහන්සි වේ. බේස්බෝල් පිට්ටනියට යෑම,චිත්‍රපට බැලීම වැනි බොහෝ සේවකයන් ඒකරාශී කරන්න පුළුවන් වැඩසටහන් පිළියෙල කරමින් සිටියි. ඉන්ජුයි වල කිම්මින්සු නගරාධිපති තුමා අද ඉහළ නිලධාරියා නායකත්වය දුන් ක්‍රමයෙන් මිදී සේවකයන්ට සතුටු වියහැකි පරිසරයක් සෑදිය යුතුයැයි පැවසුවා.

1. 다음 중 인주시의 신바람 나는 직장 문화 이벤트가 아닌 것은 무엇입니까?

පහත ඒවා අතරින් ඉන්ජුසිගේ ප්‍රසන්න වැඩ පරිසරයේ සංස්කෘතික අංගයක් නොවන්නේ කුමක්ද?

①


②


③


④


정답 1. ③

# 정보 තොරතුරු


## 직장 내에서의 호칭

වැඩපළේ පුද්ගලයන්ගේ තනතුරු නාම / ආමන්ත්‍රණ



회사에서는 사람들을 부를 때 직책에 '-님'을 붙이세요. 예를 들면 사장님, 부장님, 과장님, 대리님, 주임님, 반장님 이렇게 부르면 됩니다.

වැඩපළේදී පුද්ගලයින්ට කතා කරන විට තනතුරු නාමයට '-님' එක් කල යුතුයි. උදාහරණ ලෙස පැවසුවොත් '사장님, 부장님, 과장님, 대리님, 주임님, 반장님' ආදී ලෙස ඇමතිය යුතුයි.



동료나 비슷한 직급의 사람 부를 때 이름에 '-씨'를 붙이세요. 예를 들면 '투안 씨', '지훈 씨' 이렇게 부르면 됩니다. '씨'를 붙일 때는 성을 붙이지 않아도 됩니다.

එකට වැඩ කරන අය හා සමාන තනතුරු දරන පුද්ගලයින්ට ආමන්ත්‍රණය කරන විට නමට පසුව '-씨' යොදන්න. උදාහරණ ලෙස පැවසුවොත් '투안 씨, 지훈 씨' යනුවෙන් පැවසිය හැකියි. '-씨' යන්න එකතු කර පැවසීමේදී වාසගම භාවිතා නොකලත් කම් නැත.



그러나 직장 밖에서는 개인적으로 친한 사람에게는 '형', '누나'와 같은 호칭을 사용하여 친근함을 표기하기도 합니다.

එසේම වැඩපළෙන් පිටතදී තමාට සමීප මිත්‍ර පුද්ගලයින්ට '형', '누나' වැනි ආමන්ත්‍රණ භාවිතා කොට මිත්‍රකම් ප්‍රදර්ශණය කරයි.

### 갈등 해결 방법 ගැටුම් විසඳන ආකාරය



서로 다르다는 것을 인정하세요. '상대가 틀려서'가 아니라 '서로 다르기 때문'이에요.

එකිනෙකා වෙනස් බව පිළිගන්න. විරුද්ධ පාර්ශවය වැරදි නිසා නොව එකිනෙකා වෙනස් නිසයි.



이야기를 잘 들어 주세요. 상대방의 생각, 감정, 상황 등에 대해 정확히 이해하면 갈등의 원인을 찾을 수 있어요.

කියන දේට හොඳින් ඇහුම්කන් දෙන්න. මිතුරාගේ සිතිවිලි ,හැඟීම් ,සබඳතා ආදිය පිළිබඳ නිවැරදිව තේරුම් ගත් විට ගැටුම් වලට හේතු සොයන්න පුලුවන්.



자신의 입장 상황, 가치관 등에 대해 상대에게 적극적으로 공개하고 정확히 알리기 위해 노력하세요.

තමාගේ තත්වය, වටිනාකම ආදිය ගැන කෙලින් (ක්‍රියාශීලීව) ප්‍රසිද්ධියේ ප්‍රකාශකර, නිවැරදිව දැනුම්දීමට උත්සාහ කරන්න.



부탁이나 거절을 할 때는 '미안합니다만~', '죄송합니다만~' 등의 용어로 시작하는 것이 좋아요.

ඉල්ලීමක් කරන විට හෝ ප්‍රතික්ෂේප කරන විට '미안합니다만~', '죄송합니다만~' ආදී වචන වලින් පටන් ගන්න එක හොඳයි.



화가 나면 숫자를 1부터 10까지 세어 보세요. 화를 참지 못하면 나중에 후회하는 일이 생길 거예요.

තරහා ගිය විට 1 සිට 10 දක්වා ගණන් කර බලන්න, තරහා ඉවසන්නම බැරිනම් පසුව පසුතැවිලිවෙන්න වෙන දේවල් ගැන හිතන්න.

## EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක1 සිට අංක 2 දක්වා පින්තූරය බලා ප්‍රශ්ණයට ගැළපෙන පිළිතුර තේරීමේ ප්‍රශ්ණයකි. සවන් දීමට පෙර උදාහරණයේ අන්තර්ගතය විමසා බලන්න.

[1~2] 다음 그림을 보고 알맞은 대답을 고르십시오.
පහත පින්තූර දෙස බලා ගැලපෙන පිළිතුර තෝරන්න.

Track 120

1. 

이 사람은 누구입니까? මෙම පුද්ගලයා කවුද?

① ② ③ ④

2. 

이 사람은 지금 무엇을 하고 있습니까?
මෙම පුද්ගලයා දැන් කුමක් කරමින්ද සිටින්නේ?

① ② ③ ④



අංක 3 සහ අංක 4 පහත දැක්වෙන ප්‍රශ්ණ වලින් ගැලපෙන දේ තෝරන ප්‍රශ්ණයකි. අංක 5 සංවාදයට සවන් දී ප්‍රශ්නයට ගැලපෙන පින්තූරය තෝරන ප්‍රශ්නය වේ. සංවාදයට සවන් දීමට පෙර පිළිතුරෙහි අන්තර්ගතය එක් වරක් විමසා බලන්න.



[3~4] 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.

3. ① 그건 오해예요. ② 벌써 화해했어요.
③ 오해가 풀려서 다행이에요. ④ 빨리 화해했으면 좋겠어요.

4. ① 네, 규율이 좀 엄격해요. ② 네, 서로 위해 주는 편이에요.
③ 상사가 좀 무서운 편이에요. ④ 분위기가 자유로운 편은 아니에요.

5. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
සංවාදය සවන් දී ප්‍රශ්ණ වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

남자의 회사의 분위기는 어떻습니까?
පිරිමි පුද්ගලයාගේ වැඩපොළේ වටපිටාව කොහොමද?

① 
② 
③ 
④ 



## 듣기 대본 ශ්‍රවණ පිටපත

1. ① 남: 상사입니다. ජ්‍යෙෂ්ඨයා වේ.
   ② 남: 동료입니다. සහයකයන් වේ.
   ③ 남: 윗사람입니다. උසස් අය වේ.
   ④ 남: 부하 직원입니다. කනිෂ්ඨ අය වේ.
2. ① 여: 때리고 있습니다. ගසමින් ඉන්නවා.
   ② 여: 화를 내고 있습니다. තරහ ගස්සවමින් ඉන්නවා.
   ③ 여: 사과를 하고 있습니다. බනිමින් ඉන්නවා.
   ④ 여: 싸움을 하고 있습니다. ගහගනිමින් ඉන්නවා.
3. 남: 죄송해요. 제가 오해를 했어요. සමාවෙන්න. මම වැරදි වැටහීමකයි හිටියේ.
4. 여: 직장 분위기가 좋은 편인 것 같아요. හොඳ සේවා පරිසරයක් තියනවා වගේ?
5. 남: 수피카 씨 회사는 어때요? සුපිකා මහත්මියගේ ආයතනය කොහොමද?
   여: 동료들이 너무 좋아요. 서로 위해 주고, 배려해 주는 편이에요.
   සේවකයන් ගොඩක් හොඳයි. එකිනෙකාට ගෞරව කරනවා.
   남: 정말 부럽네요. ඇත්තටම ඊරිසියා හිතෙනවා.

정답 1. ② 2. ② 3. ③ 4. ② 5. ①

## 확장 연습 වැඩිදුර අභ්‍යාස

L-38

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදය හොඳින් සවන්දී ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

   남자의 회사는 분위기가 어떻습니까? පිරිමි පුද්ගලයාගේ ආයතනය කෙසේද?


   ① 상사가 엄격합니다. ② 일이 많지 않습니다.
   ③ 동료들끼리 잘 지냅니다. ④ 규율이 아주 엄격합니다.

## 확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 바트 씨 회사는 분위기가 어때요? පීටර් මහතා, ආයතන පරිසරය කෙසේද?
   남: 좋아요. 동료들끼리 사이도 좋고 상사들도 많이 배려해 줘요. 그래서 일이 많아도 모두들 즐겁게 일해요.
   හොඳයි මිතුරන් සමාගමත් හොඳ වන අතර ප්‍රධානී තුමත් ගොඩක් සලකනවා එම නිසා වැඩ වැඩි වුවත් සැම දෙනාම සතුටින් වැඩ කරනවා.
   여: 정말 부러워요. 우리 회사는 규율이 엄격해서 회사 분위기가 딱딱하거든요.
   ඇත්තටම ඉරිසියයි. අපේ සමාගම දැඩි විනයකින් යුතුව ඇති අතර සමාගමේ වාතාවරණය අපහසු වේ.

정답 1. ③

# EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සහ අංක 2 පින්තූර බලා නිවැරදි පිළිතුර තෝරන ගැටළුවයි. ඉගෙන ගත් දේ මතක් කරමින් ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.


[1~2] 다음 그림을 보고 맞는 단어나 문장을 고르십시오.
පහත පින්තූර බලා ගැළපෙන වචනය හෝ වාක්‍යය තෝරන්න.

1. 

① 상사 ② 부하
③ 동료 ④ 친구

2. 

① 때리고 있습니다.
② 사과를 하고 있습니다.
③ 말다툼을 하고 있습니다.
④ 다른 사람에게 맞고 있습니다.



අංක 3 සහ අංක 4 නිවැරදි පිළිතුර තෝරන ගැටළුව වන අතර අංක 5 ඡේදය කියවා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන ගැටළුවයි.

[3~4] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오.
හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

3.

여: 아직도 수미 씨에게 화가 났어요? තවමත් සුමී මහත්මියත් සමග තරහෙන්ද ඉන්නේ?
남: 아니요, 벌써 ______________. නැහැ, දැනටමත් මිත්‍ර වුණා.

① 오해했어요 ② 화해했어요 ③ 짜증을 냈어요 ④ 싸움을 했어요

4.

남: 수미 씨 직장은 규율이 엄격한 편이에요? සුමී මහත්මියගේ වැඩ බිමේ නීති රීති තදයි ද?
여: 아니요, 좀 ______________. 그래서 출퇴근 시간이 따로 없어요.
නැහැ ටිකක් නිදහස්. එමනිසා වැඩට යන එන වේලාවක් වෙනම නැහැ.

① 나빠요 ② 엄격해요 ③ 위해줘요 ④ 자유로워요

5. 다음 질문에 답하십시오. මීලඟ ගැටළුවට පිළිතුරු සපයන්න.

좋은 직장 분위기를 만들기 위해서는 모든 사람의 노력이 필요합니다. 직장에서는 서로에게 웃는 얼굴로 이야기하는 게 좋습니다. 그리고 서로를 배려하는 마음을 갖는다면 화내는 일이 없어질 것입니다. ㉠ ______________ 전에 상대방의 마음을 한 번 더 생각하는 것도 즐거운 직장을 만드는 방법입니다.

හොඳ වැඩ පරිසරයක් සෑදා ගැනීමට නම් සියලුම පුද්ගලයන්ගේ උත්සාහය අවශ්‍යයි. වැඩපොළේදී එකිනෙකා සිනහා මුහුණින් කතා කරන එක හොඳයි. ඒ වගේම එකිනෙකා ගැන සිතා බලනවා නම් කේන්ති යන අවස්ථාවන් නැති වී යනු ඇත. ㉠ බැනීමට පෙර විරුද්ධ පාර්ශවයේ සිතිවිලි/අදහස් එක් වරක් හොඳින් සිතා බැලීම විනෝදජනක සේවා ස්ථානයක් නිර්මාණය කිරීමේ එක් ක්‍රමයකි.

㉠에 들어갈 알맞은 말을 고르십시오. ㉠ හිස්තැනට ගැලපෙන වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.

① 웃기 ② 화내기 ③ 배려하기 ④ 오해하기

정답 1. ① 2. ③ 3. ② 4. ④ 5. ②



## 확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 저는 고향에 있는 가족이 생각날 때 ________을/를 봅니다. 가족들 얼굴을 보면 기분이 좀 좋아집니다.

   මම ගමේ ඉන්න මගේ පවුලේ අය මතක් වෙන විට (ඡායාරූපය) බලනවා. පවුලේ අයගේ මුහුනු දැක්කම හිතට ලොකු සතුටක් දැනෙනවා.

   ① 신문　② 사진
   ③ 영화　④ 통장

2. 우리 회사는 분위기가 아주 좋습니다. 동료들끼리 ________ 위해 주고 항상 웃으면서 이야기를 나눕니다.

   අපේ සමාගමේ වාතවරණය බොහොම හොඳයි. එකට වැඩ කරන අය (එකිනෙකාව) හොඳින් තේරුම් ගනිමින් එකිනෙකා සමග සිනහ වෙමින් කතාබහ කරනවා.

   ① 서로　② 벌써
   ③ 전혀　④ 아직

3. 직장에서 즐겁게 ________ 동료들과 잘 지내는 것이 중요합니다. 서로 배려하고 웃으면서 이야기하는 것이 좋습니다.

   වැඩබිමේදී සතුටින් (ජීවත් වෙමින්) ඔබගේ සගයන් සමඟ සතුටින් වැඩ කටයුතු කිරීම වැදගත් වේ.

   ① 정리하니까　② 정리하려면
   ③ 생활하니까　④ 생활하려면

정답 1. ② 2. ① 3. ④

## 발음 උච්චාරණය P-17

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

කොරියානු භාෂාවේ ව්‍යඤ්ජන දෙකක් පිළිවෙලින් යෙදේ නම් විවිධ ශබ්ද වෙනස්කම් ඇති වේ. නමුත් ‘ㄹ+ㄱ(ㄲ)/ㄷ(ㅌ,ㄸ)/ㅂ(ㅍ,ㅃ)/ㅅ(ㅆ)/ㅈ(ㅊ,ㅉ)/ㅎ’ වැනි අවස්ථා වලදී කිසිදු ශබ්ද වෙනස්කමක් සිදුවන්නේ නැත.

(1) 딸기, 얼굴, 날개, 갈비　(2) 슬기, 즐기다, 질기다
(3) 딸기가 맛있어요.　(4) 즐거운 방학이에요.